AMG GRAPHITE GK

# සීමාසහිත බෝගල ග්‍රැෆයිට් ලංකා පොදු සමාගම

## ඒකාබද්ධ කළමනාකරන පද්ධතිය

# ඒකාබද්ධ කළමනාකරන පද්ධති ප්‍රතිපත්තිය

ISO 9001:2015, ISO 14001:2015, සහ OHSAS 18001:2007 තත්ත්ව ප්‍රමිතීන්ට යටත් ව අප ගේ කැනීම් කටයුතුවල දී සහ අප නියෝජනය කරන ප්‍රජාව තුළ විශිෂ්ඨ තත්ත්ව ආරක්ෂණය, පරිසර සංරක්ෂණය, අනතුරු වළක්වා ගැනීම, සෞඛ්‍යසම්පන්න භාවය, සහ ආරක්ෂාව වෙනුවෙන් බෝගල ග්‍රැෆයිට් සමාගම කැප වී සිටි යි.

ඒකාබද්ධ කළමනාකරන පද්ධතිය - එහි ප්‍රමිතීන්, අරමුණු, වැඩසටහන්, සහ ක්‍රියාමාර්ග - ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම මගින් සමාජයට වගකියන ආදර්ශ කැනීම් ආයතනයක් බවට පත් වීමට අපි කැප වී සිටිමු. සියලු කොටස්කරුවන් සමග විශ්වාසවන්ත හා චිරස්ථායී සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම වෙනුවෙන් සියලු අදාල රජයේ නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති, සහ කර්මාන්ත ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඉහළ අනුකූලතා ශ්‍රේණිගත කිරීමක් සඳහා අපි කැප වී සිටිමු. පහත සඳහන් ආකාරයට අප ගේ ගනුදෙනුකරුවන් නිරතුරු ව සතුටු කරවීමටත් අප ගේ ඒකාබද්ධ කළමනාකරන පද්ධතිය වැඩි දියුණු කිරීමටත් අපි කැප වී සිටිමු.

- තත්ත්වාරක්ෂණය, මානව සෞඛ්‍යාරක්ෂාව, ප්‍රජාව, සහ පරිසරය මත උපරිම සාධනීය බලපෑමක් ඇතිවන ආකාරයට ලබා ගත හැකි හොඳ ම තාක්ෂණය උපයෝගී කර ගනිමින් සුරක්ෂිත හා වගකියන්නා වූ මෙහෙයුම් සිදු කිරීම.
- ඵලදායී සහ ගෝලීය වශයෙන් තරඟකාරී මෙහෙයුම් වෙනුවෙන් ආයතනික ශක්‍යතා සහ සේවක නිපුණතා වර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම.
- හිමිකාරිත්වය හා පක්ෂපාතිත්වය පිළිබඳ ගැඹුරු වැටහීමක් ලබා ගැනීම වෙනුවෙන් තම රැකියාවේ කාර්යසාධනය වෙනුවෙන් අවධානය සහ විනය පවත්වාගෙන යාම සඳහා සේවකයින් අභිප්‍රේරණය කිරීම.
- අනතුරු, රෝගාබාධ හා සංකූලතා වැළැක්වීම සඳහා සියලු අංශ සුරක්ෂිත ව, හොඳින් නඩත්තු කර, පිළිවෙලට, සහ පිරිසිදු ව පවත්වා ගෙන යාම.
- කැපවීම හා වගකිවයුතුභාවය පිළිබඳ හැඟීමක් වර්ධනය කිරීම සඳහා අප ගේ සේවකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සහ ව්‍යාපාර හවුල්කරුවන් අතර ඒකාබද්ධ කළමනාකරණ පද්ධතිය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම.
- ධාරක හා අසල්වාසී ප්‍රජාවන් හි ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම වෙනුවෙන් ප්‍රජා සංවර්ධනයට දායක වීම.
- නිසි අවශ්‍යතා සපුරාලන තත්ත්වාරක්ෂණය, පරිසරය සහ ආරක්ෂක කළමනාකරණ පද්ධතිය තුලින් අඛණ්ඩව වැඩි දියුණු කිරීම, නීති හා අනෙකුත් අවශ්‍යතා සහිතව වගකීම් හා පරිසර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම.
- පරිසර දූෂණය වැළැක්වීම සහ ආයතනයේ සන්දර්භයට අදාල අනෙකුත් විශේෂිත වගකීම් ඇතුළත් පරිසරය ආරක්ෂා කිරීම.

කොටස්කරුවන් ගේ විශ්වාසය වර්ධනය කිරීම වෙනුවෙන් අප ගේ ඒකාබද්ධ කළමනාකරන පද්ධතියේ කාර්යසාධනය නිරතුරුව ක්‍රියාවට නැංවීමටත්, මැනීමටත්, අධීක්ෂණයටත්, සමාලෝචනයටත්, සහ විවෘත ව සන්නිවේදනය කිරීමටත් අපි තවදුරටත් කැප වී සිටිමු. එසේ ම, එම ප්‍රතිපත්තිය සියලු මට්ටම්වල සේවකයින් වෙත සන්නිවේදනය වී ඔවුන් විසින් වටහා ගනු ලබනු ඇති බවටත් මහජනතාව සහ ප්‍රතිපත්තිය පිළිබඳ යුක්තිසහගත උනන්දුවක් පවතින අය වෙනුවෙන් ප්‍රසිද්ධ කර තබන බවටත් අපි සහතික වෙමු.

.................................................... 06.09.2018

අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී දිනය